# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 දෙසැම්බර්

සමාජීය විද්‍යා පීඨය

මනෝවිද්‍යාව (නව/පැරණි නිර්දේශය)

සෞඛ්‍ය මනෝවිද්‍යාව **PSYC- E 3025**

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. 'සෞඛ්‍ය මනෝවිද්‍යාව' කෙටියෙන් හඳුන්වා දී සෞඛ්‍ය මනෝවිද්‍යාවේ උපක්ෂේත්‍ර පැහැදිලි කරන්න.

02. මනෝභෞතික මූලාශ්‍ර සහ චර්යාමය මූලාශ්‍ර පදනම් කරගෙන පුද්ගල පෞරුෂය සෞඛ්‍යය කෙරෙහි බලපාන ආකාරය සාකච්ඡා කරන්න.

03. 'ප්‍රජානන සෞඛ්‍යය' (cognitive health) යන්න නිර්වචනය කර නිරෝගිමත් පුද්ගලයෙක් නිර්මාණය කිරීම සඳහා ප්‍රජානන සෞඛ්‍යයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

04. 'ක්ලමථය (Stress) නිරන්තරයෙන් ඍණාත්මක නොවේ' මෙම ප්‍රකාශයට පක්ෂව හෝ විපක්ෂව කරුණු ඉදිරිපත් කරන්න.

05. මනස හා කය අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධතාවකි. ග්‍රීක හා මධ්‍යතන දාර්ශනික අදහස් පදනම් කරගෙන කය හා මනස අතර සබඳතාව තහවුරු කරන්න.

06. ජීවවෛද්‍ය ආකෘතියේ පවතින දුර්වලතා මගහරවා ගැනීමට ජීවමනෝසමාජීය ආකෘතිය දක්වන දායකත්වය අගයන්න.

07. සෞඛ්‍යාභිවර්ධනයේ මූලිකාංග හඳුන්වා සෞඛ්‍යාභිවර්ධනය සඳහා වෛද්‍ය සන්නිවේදනය වැදගත්වන ආකාරය පෙන්වා දෙන්න.

08. පුද්ගල සෞඛ්‍යය ඉහළ නැංවීම සඳහා චිත්තවේග කළමනාකරණයේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

*******************************